79438

OL/2018/44/S-I, II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**44 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2018**

නැටුම් (දේශීය) I, II
நடனம் (சுதேச) I, II
Dancing (Oriental) I, II

2018.12.11 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## නැටුම් (දේශීය) I

**විශේෂ උපදෙස් :**

※ සියලු ම අයදුම්කරුවන් **I කොටසේ** ප්‍රශ්න **30** ට ම පිළිතුරු සැපයිය යුතු ය. එයට අමතරව **II උඩරට** නර්තනය හෝ **III පහතරට** නර්තනය හෝ **IV සබරගමු** නර්තනය යන කොටස් **තුනෙන් එක් කොටසකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය.

※ **II, III** හා **IV** වන කොටස්වලින් කලවමේ ප්‍රශ්න තෝරා **නොගත යුතු ය.** ඔබ පිළිතුරු සපයන්නේ කුමන කොටසට දැයි පිළිතුරු පත්‍රයේ පැහැදිලිව ලියා දැක්විය යුතු ය.

**සැලකිය යුතුයි:**

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

### I කොටස

- අංක **1** සිට **10** තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන තෝරන්න.

**1.** වන්නමක ............................ මගින් පිළිබිඹු වන්නේ එහි නාදමාලාවයි.
(1) බෙරපදය (2) තානම (3) ප්‍රස්තාරය (4) තිත

**2.** කාසි රටේ සිට පැමිණි බැව් කියන ............................ සොකරියගේ ස්වාමි පුරුෂයා වේ.
(1) සොත්තානා (2) වෙදරාළ (3) අඬබෙරකරු (4) ගුරුහාමි

**3.** මහනුවර ඇසල පෙරහැර, මුල් දින පහ වීදි සංචාරය කරනු ලබන්නේ.................... පෙරහැර නමිනි.
(1) රන්දෝලි (2) කුඹල් (3) වේල් (4) නවම්

**4.** ශාන්තිකර්මවල දක්නට ලැබෙන නමස්කාර, සන්න, සැහැලි හඳුන්වනු ලබන්නේ ............................ ගායනා ලෙස ය.
(1) තාලාත්මක (2) අඝාතාත්මක (3) අනාඝාතාත්මක (4) ලයාන්විත

**5.** ආදරය, දුක, පිළිකුල වැනි මිනිස් හැඟීම් ............................ අභිනයෙන් නිරූපණය කෙරේ.
(1) ආංගික (2) වාචික (3) සාත්වික (4) ආහාර්ය

**6.** මාත්‍රා $2 + 2 + 3$ තිත් රූපය නම් කරනු ලබන්නේ ............................ තුන්තිත ලෙස ය.
(1) දෙසුළු මැදුම් (2) සුළු මැදුම් මහ (3) දෙමැදුම් මහ (4) සුළු දෙමැදුම්


[දෙවැනි පිටුව බලන්න.

7. නර්තන ශිල්පියකු .............................. කිරීමේදී සමේ වර්ණය පිළිබඳ සැලකිලිමත් විය යුතු ය.
(1) රංග රචනය (2) අංග රචනය (3) තිර රචනය (4) රේඛා රචනය

8. දකුණු ඉන්දියාවේ නාගපට්ටනමෙන් ගෙන්වාගත් .................................. නම් පඬිවරයා විසින් උඩරට වන්නම් රචනා කළ බැව් කියැවේ.
(1) විද්‍යාලංකාර (2) ශෝභාලංකාර (3) වික්‍රමාලංකාර (4) ගණිතාලංකාර

9. සරස්වතී මණ්ඩපය, පොළොන්නරු යුගයේදී .............................................. රජු විසින් ඉදි කළ බව චූලවංශයේ සඳහන් වේ.
(1) දෙවන පරාක්‍රමබාහු (2) පළමුවන පරාක්‍රමබාහු
(3) දෙවන රාජසිංහ (4) කීර්ති ශ්‍රී රාජසිංහ

10. "සොබමන් දෙවිවරු ....................................... එතැනට" යන කවි පාදය චාමර ගායනයට අයත් වේ.
(1) දෙදෙනෙක් (2) සදෙනෙක් (3) තිදෙනෙක් (4) සොලොසක්

11.


ඉහත ඡායාරූපවලින් පිළිබිඹු වන රසයන් වනුයේ,
(1) ශාන්ත, කරුණ, බිභත්ස්‍ය වේ (2) බිභත්ස්‍ය, කරුණ, රෞද්‍ර වේ.
(3) වීර, හාස්‍ය, කරුණ වේ. (4) හාස්‍ය, කරුණ, වීර වේ.

12. කාන්තා ලාලිත්‍යය මතුකර පෙන්වන නර්තනයකි.
(1) කළගෙඩි (2) ලී කෙළි (3) කඩු (4) බුම්මැඩි

13. උපුල්වන් දේවාලයේ හින්දු බාලිකාවන් 500ක් නැටූ බව වාර්තා කරන ලද්දේ,
(1) පාහියන් භික්ෂුව ය. (2) ස්පිල් බර්ජන් ය. (3) රොබට් නොක්ස් ය. (4) ඉබන් බතූතා ය.

14. ගොයම් කැපීමට සමාන දමිළ නර්තනය වනුයේ,
(1) අරචිවෙට්ටු ය. (2) කුම්මි ය. (3) චෙම්බු ය. (4) සූලකු ය.

15. වර්ණ, රේඛා, හැඩතල භාවිත ඇඳීමේ කලාව සෘජුවම දක්නට ලැබෙන්නේ,
(1) පහන් මඩුවේදී ය. (2) දෙවොල් මඩුවේදී ය. (3) තොරන් යාගයේදී ය. (4) බලි යාගයේදී ය.

16. '**තානායම්පොළ**' යනුවෙන් හඳුන්වනු ලබන්නේ,
(1) සොකරි රඟමඬල ය. (2) කෝලම් රඟමඬල ය.
(3) නාඩගම් රඟමඬල ය. (4) නව රඟමඬල ය.

17. '**අසුර යක්කම**' ඇතුළත් ශාන්තිකර්මය අයත් වනුයේ,
(1) උඩරට සම්ප්‍රදායට ය. (2) පහතරට සම්ප්‍රදායට ය.
(3) සබරගමු සම්ප්‍රදායට ය. (4) උඩරට හා පහතරට සම්ප්‍රදායට ය.

18. රාධා ක්‍රිෂ්ණ ප්‍රේම වෘත්තාන්තය තේමා කරගනිමින් නිර්මාණය වී ඇති මනිපුරි නර්තනයකි.
(1) භාවලීලා (2) රාස්ලීලා (3) පුංචොලම් (4) සංකීර්තන්

/තුන්වැනි පිටුව බලන්න.

**19.** 'කච්ච කෙට්ට' නම් අභ්‍යාස පුහුණුව ලබා දෙන නර්තන සම්ප්‍රදාය වනුයේ,
(1) මනිපුරි ය. (2) කතක් ය. (3) කථකලි ය. (4) භරත ය.

**20.**


A


B


C

ඉහත රූපවලින් මානුෂ හා අතිමානුෂ චරිත අනුපිළිවෙළින් දැක්වෙන්නේ,
(1) A හා B රූපවලිනි. (2) A හා C රූපවලිනි.
(3) B හා C රූපවලිනි. (4) B හා A රූපවලිනි.






**21.** සංගීතයේ මාධ්‍ය නාද වන්නාසේ ම නර්තනයේ මාධ්‍යය වනුයේ,
(1) වාදනයයි. (2) ගායනයයි. (3) චලනයයි. (4) වර්ණයයි.

**22.** තාලය තැබීමට යොදා ගන්නා ඝන වාද්‍ය භාණ්ඩ වේ.
(1) තාලම්පට, අත්මිණිය, තලිය (2) තාලම්පට, බුම්මැඩිය, අත්මිණිය
(3) අත්මිණිය, හක්ගෙඩිය, තාලම්පට (4) අත්මිණිය, හක්ගෙඩිය, රබු

**23.** කොහොඹාහැල්ල, මුදුන් තාලය, දෙවොල් යන නර්තන දක්නට ලැබෙන්නේ පිළිවෙළින්,
(1) කොහොඹා කංකාරිය, කිරිමඩුව සහ හැල්ලම්මඩුවේ ය.
(2) කොහොඹා කංකාරිය, කිරිමඩුව සහ ගීමඩුවේ ය.
(3) කොහොඹා කංකාරිය, පහන්මඩුව සහ පූනාමඩුවේ ය.
(4) කොහොඹා කංකාරිය, පහන්මඩුව සහ දෙවොල්මඩුවේ ය.

**24.** කැලණිය විශ්වවිද්‍යාලයීය සෞන්දර්ය අධ්‍යයන ආයතනය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය බවට පත් වන්නේ,
(1) 1972 වසරේදී ය. (2) 1974 වසරේදී ය. (3) 1978 වසරේදී ය. (4) 2005 වසරේදී ය.

● ප්‍රශ්න අංක **25** සහ **28** සඳහා නිවැරදි පිළිතුරු පහත වගුව ඇසුරින් තෝරන්න.

| | 1 | 2 | 3 |
|---|---|---|---|
| A |  |  |  |
| B |  |  |  |

**25.** දේශීය භාණ්ඩ වර්ගීකරණයේදී අතතය කොටසට අයත් භාණ්ඩ දක්නට ලැබෙන්නේ,
(1) A තීරුවේ 1 හා 2 රූපවල ය. (2) B තීරුවේ 2 හා 3 රූපවල ය.
(3) A තීරුවේ 1 හා 3 රූපවල ය. (4) B තීරුවේ 1 හා 3 රූපවල ය.

**26.** කථකලි නර්තනය සඳහා භාවිත කරනු ලබන චෙන්ගිලම් සහ චෙන්ඩාව දක්නට ඇත්තේ,
(1) A තීරුවේ 1 හා 2 රූපවල ය. (2) A තීරුවේ 2 හා 3 රූපවල ය.
(3) B තීරුවේ 2 හා 3 රූපවල ය. (4) B තීරුවේ 1 හා 3 රූපවල ය.

[හතරවැනි පිටුව බලන්න.

27. මෙලෙයි යකුන් හා රුප්පා යකුන් පුදනු ලබන්නේ,
(1) උඩරට සම්ප්‍රදායේ ය.
(2) පහතරට සම්ප්‍රදායේ ය.
(3) සබරගමු සම්ප්‍රදායේ ය.
(4) සම්ප්‍රදායන් තුනෙහිම ය.

28. දිවිකදුරුද ගස එතැන තියෙන්නේ, සත්ව්යතක් දිග .................... මෙහි හිස්තැන සම්පූර්ණ වන්නේ,
(1) සොදින් කපන්නේ ලෙසිනි.
(2) මොහොල කපන්නේ ලෙසිනි.
(3) මිල්ල කපන්නේ ලෙසිනි.
(4) විල්ල කපන්නේ ලෙසිනි.

29. වෙහෙර විහාරස්ථානවල බුදු ගුණ ගයමින් කරනු ලබන පන්තේරු නර්තනයකි.
(1) ගාහක වන්නම
(2) දොරකඩ අස්නය
(3) සුවිසි විවරණ
(4) කුවේණි අස්නය

30. සැලලිහිණිය, තිත්ත බත, පරෙවිය මුද්‍රා නාට්‍ය නිර්මාණය කරන ලද්දේ,
(1) ඒ. ඉඹුල්ගොඩ ය.
(2) නිමල් වෙල්ගම ය.
(3) වසන්ත කුමාර ය.
(4) ප්‍රේමකුමාර එපිටවෙල ය.

## II කොටස - උඩරට නර්තනය

31. උඩරට නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ ලෙස සැලකෙන්නේ,
(1) මහනුවර, කුරුණෑගල සහ තංගල්ල ය.
(2) මහනුවර, කුරුණෑගල සහ කෑගල්ල ය.
(3) දෙව්නුවර, කුරුණෑගල සහ ගාල්ල ය.
(4) දෙව්නුවර, උඩුනුවර සහ ගාල්ල ය.

32. කොහොඹා කංකාරිය ශාන්තිකර්මයේ එන නර්තනාංග දෙකකි.
(1) අස්නේ සහ වැදි යක්කම
(2) කොහොඹාහැල්ල සහ අයිලේ යැදීම
(3) අස්නේ සහ යක් ඇනුම
(4) යක් ඇනුම සහ හඟලේ යැදීම

33. සුළු මැදුම් (2 + 3) දෙතිතට අයත් අඩව්ව කුමක් ද?
(1) තත් තකට තක රොං
(2) තත් තොග තක තොග
(3) තත් තහර්ජිත් ජිත් තහර්ජිත්
(4) තත්ත තරිතරි තතරි තරිතරි

34. උඩරට වෙස් නර්තනයට අයත් ආභරණ වනුයේ,
(1) උල්උඩය හා හැඩ කැල්ලයි.
(2) අවුල්හැරය හා කාගුල් කුට්ටමයි.
(3) උල්උඩය හා දෙවොල් තොප්පියයි.
(4) අවුල්හැරය හා ශිඛාබන්ධනයයි.

35. දෙතිතට අයත් වන්නම් දෙකකි.
(1) සැව්ලා සහ තුරඟා
(2) සිංහරාජ සහ හනුමා
(3) හනුමා සහ සැව්ලා
(4) හනුමා සහ තුරඟා

36. "වන පැත්ත බිය පත්ව සයනම් - දුටත් යනෙන විටත් දුවන" මෙම කවිය අයත් වනුයේ,
(1) සිංහරාජ වන්නමට ය.
(2) හනුමා වන්නමට ය.
(3) මුසලඩි වන්නමට ය.
(4) වෛරෝඩි වන්නමට ය.

37. දොං ජිංත ගත දොංත යන බෙර පදය අයත් වනුයේ,
(1) මාත්‍රා 123 + 1234 දෙතිතට ය.
(2) මාත්‍රා 12 + 123 දෙතිතට ය
(3) මාත්‍රා 12 + 1234 දෙතිතට ය
(4) මාත්‍රා 123 + 123 තනිතිතට ය

38. කුදාංත ගත දොම් වට්ටම නර්තනය කරනු ලබන්නේ
(1) දෙසුළු මහ තුන්තිතට ය.
(2) සුළු මැදුම් මහ තුන්තිතට ය.
(3) මැදුම් මහ දෙතිතට ය.
(4) සුළු මහ දෙතිතට ය.

39. කොහොඹා යක් කංකාරිය සහ සමාජය කෘතිය රචනා කරන ලද්දේ
(1) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර ය.
(2) මහාචාර්ය මුදියන්සේ දිසානායක ය.
(3) මහාචාර්ය තිස්ස කාරියවසම් ය.
(4) මහාචාර්ය ලයනල් බෙන්තරගේ ය.

40. ගොයම් නර්තනය නිර්මාණය කර වේදිකාවට ගෙන ඒමේ ගෞරවය හිමි වනුයේ,
(1) ප්‍රවීණ නර්තන ශිල්පී ප්‍රේමකුමාර එපිටවලට ය.
(2) ප්‍රවීණ නර්තන ශිල්පී නිමල් වෙල්ගමට ය.
(3) ආචාර්ය එස්. පණිභාරතට ය.
(4) ආචාර්ය චිත්‍රසේනයන්ට ය.

[පස්වැනි පිටුව බලන්න.

## III කොටස - පහතරට නර්තනය

**31.** පහතරට නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ ලෙස සැලකෙන්නේ
(1) මාතර, බෙන්තර සහ නයිවල ය.
(2) මාතර, බෙන්තර සහ රයිගම ය.
(3) කළුතර, බෙන්තර සහ රත්නපුරය ය.
(4) කළුතර, බෙන්තර සහ මහනුවර ය.

**32.** දෙවොල්මඩු ශාන්තිකර්මයේ එන නර්තනාංග දෙකකි,
(1) තෙල්මේ සහ මිල්ල කැපීම
(2) අඹ විදමන සහ මිල්ල කැපීම
(3) තෙල්මේ සහ දෙවොල්
(4) අඹ විදමන සහ දෙවොල්

**33.** සුළු මහ (2 + 4) දෙතිතට අයත් ඉරට්ටිය කුමක් ද?
(1) දොම් තත් දිමි ගත ගුගුදිත
(2) ගුද ගති ගත ගුද
(3) දිං ගදිත තං දොංත
(4) තකදිත් තක දොම්

**34.** පහතරට තෙල්මේ ඇඳුම් කට්ටලයට අයත් වනුයේ,
(1) සේලය සහ කාගුල් කුට්ටමයි.
(2) තෙල්කච්චිය සහ අවුල්හැරයයි.
(3) සේලය සහ බුබුලු පටියයි.
(4) තෙල්කච්චිය සහ පබලු හැට්ටයයි.

**35.** තනිතිතට අයත් සින්දු වන්නම් දෙකකි.
(1) අනුරාග දණ්ඩ තාලය සහ හනුමන්තා තාලය
(2) ශුද්ධ තාලය සහ හනුමන්තා තාලය
(3) නාතිලිංචි තාලය සහ හනුමන්තා තාලය
(4) නාතිලිංචි තාලය සහ අනුරාගදණ්ඩ තාලය

**36.** සිරි පිර ගිරි මුදුනත සුර - පුර ලෙසිනා, මෙම කවිය අයත් වනුයේ,
(1) නාතිලිංචි තාලයට ය.
(2) අනුරාගදණ්ඩ තාලයට ය.
(3) ශුද්ධ තාලයට ය.
(4) ඊශ්වරකුණ්ඩ තාලයට ය.

**37.** ගුං දෙගත ගත්ත ගුං යන බෙර පදය අයත් වනුයේ,
(1) මාත්‍රා 123 + 1234 දෙතිතට ය.
(2) මාත්‍රා 12 + 123 දෙතිතට ය.
(3) මාත්‍රා 12 + 1234 දෙතිතට ය.
(4) මාත්‍රා 123 + 123 තනිතිතට ය.

**38.** ගුද ගති ගත වට්ටම නටනු ලබන්නේ,
(1) සුළු තනි තිතට ය.
(2) මැදුම් තනි තිතට ය.
(3) මහ තනිතිතට ය.
(4) මැදුම් මහ තනිතිතට ය.

**39.** පහතරට ශාන්තිකර්ම සාහිත්‍ය කෘතිය රචනා කරන ලද්දේ,
(1) මහාචාර්ය ආරියරත්න කළුආරච්චි ය.
(2) මහාචාර්ය ජයසේන කෝට්ටගොඩ ය.
(3) මහාචාර්ය ලයනල් බෙන්තරගේ ය.
(4) මහාචාර්ය තිස්ස කාරියවසම් ය.

**40.** ප්‍රථමවරට පහතරට නර්තන ශිල්පය නිර්මාණාත්මකව වේදිකාවට ගෙන ඒමේ ගෞරවය හිමි වනුයේ,
(1) සචිරිස් සිල්වාට ය.
(2) ඩී. වී. හීන්නිලමේට ය.
(3) කේ. ඇස්. ප්‍රනාන්දුට ය.
(4) එස්. එල්. එච්. ප්‍රනාන්දුට ය.

## IV කොටස - සබරගමු නර්තනය

**31.** සබරගමු නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ ලෙස සැලකෙන්නේ,
(1) රත්නපුර, බලංගොඩ සහ මල්වාන ය.
(2) රත්නපුර, බලංගොඩ සහ කලවාන ය.
(3) බලංගොඩ, අම්බලන්ගොඩ සහ මල්වාන ය.
(4) බලංගොඩ, අම්බලන්ගොඩ සහ කලවාන ය.

**32.** පහන්මඩුව ශාන්තිකර්මයේ එන නර්තනාංග දෙකකි.
(1) දේව කෝල්පාඩුව සහ කෝල්පාඩුව වේ.
(2) දෙවොල් නැටීම සහ රාමා යක්කම වේ.
(3) දේව කෝල්පාඩුව සහ මුදුන් තාලය වේ.
(4) දෙවොල් නැටීම සහ අසුර යක්කම වේ.

/හයවැනි පිටුව බලන්න.

**33.** සුළු මැදුම් 2 + 3 දෙතිතට අයත් අඩව්ව කුමක් ද?
(1) තත් තරිඟු තත් තකට
(2) ජිං කිටිතත් තත් කිටිතක
(3) තා තත්ජිත් තකට තත්ජිත්
(4) තහර්ද තත් තත්

**34.** සබරගමු පබළු ඇඳුම් කට්ටලයට අයත් වනුයේ,
(1) අවුල් හැරය සහ ඉනපටියයි.
(2) ශිඛාබන්ධනය සහ හැඩ කැල්ලයයි.
(3) අවුල් හැරය සහ නෙත්තිමාලයයි.
(4) නෙත්තිමාලය සහ හැඩ කැල්ලයයි.

**35.** දෙතිතට අයත් වන්නම් දෙකකි.
(1) කොවුලා වන්නම සහ මණ්ඩුක වන්නම
(2) කොවුලා වන්නම සහ විරාඩි වන්නම
(3) කොවුලා වන්නම සහ අනිලා වන්නම
(4) අනිලා වන්නම සහ විරාඩි වන්නම

**36.** "රුව සමනා, උගත් මනා - ඉසි වඩනා, රිටු නොමිනා" මෙම කවිය අයත් වනුයේ,
(1) මණ්ඩුක වන්නමට ය.
(2) විරාඩි වන්නමට ය.
(3) කොවුලා වන්නමට ය.
(4) ආනන්ද වන්නමට ය.

**37.** ජිං ජිමිත තක් තකට යන බෙර පදය අයත් වනුයේ,
(1) මාත්‍රා 123 + 1234 දෙතිතට ය.
(2) මාත්‍රා 12 + 123 දෙතිතට ය.
(3) මාත්‍රා 12 + 1234 දෙතිතට ය.
(4) මාත්‍රා 123 + 123 තනිතිතට ය.

**38.** ගමන් මාත්‍රය නටනු ලබන්නේ,
(1) මැදුම් තනි තිතට ය.
(2) මහ තනි තිතට ය.
(3) සුළු මැදුම් දෙතිතට ය.
(4) මැදුම් මහ දෙතිතට ය.

**39.** "සමන් දේවාල පුදසිරිත්" කෘතිය රචනා කරන ලද්දේ,
(1) මහාචාර්ය තිස්ස කාරියවසම් ය.
(2) මහාචාර්ය ශ්‍රියානි රාජපක්ෂ ය.
(3) මහාචාර්ය ජයසේන කෝට්ටගොඩ ය.
(4) මහාචාර්ය මුදියන්සේ දිසානායක ය.

**40.** ප්‍රථම වරට සබරගමු නර්තන ශිල්පය වේදිකාවට ගෙන ඒමේ ගෞරවය හිමි වනුයේ,
(1) ඩී. වී. හීන්නිලමේට ය.
(2) ගලුකාගම හීන් මහත්තයාට ය.
(3) රද්දැල්ලේ පොඩි මහත්තයාට ය.
(4) එන්. ජී. සිරිබෝහාමිට ය.

* *

/හත්වැනි පිටුව බලන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**44 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2018

නැටුම් (දේශීය) I, II
நடனம் (சுதேச) I, II
Dancing (Oriental) I, II

## නැටුම් (දේශීය) II

* **පළමුවැනි** ප්‍රශ්නය අනිවාර්ය වේ.
* **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම ලකුණු 12 බැගින් හිමි වේ.

**1.** **සියලු ම** ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ **අදාළ ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.**

(i) අයිලය යනු උඩරට නර්තන සම්ප්‍රදායට අයත් ........................................ ශාන්තිකර්මයේ ප්‍රධාන සැරසිල්ලකි.

(ii) කෝලම් නාටකයේ ප්‍රධාන ලක්ෂණයක් වනුයේ එක් එක් චරිත සඳහා ............................ පැළඳීමයි.

(iii) ආහාර්ය අභිනයේ ප්‍රධාන කොටස් දෙක වනුයේ අංග රචනය සහ ......................... රචනයයි.

(iv) කථකලි නර්තනයේ වාද්‍ය භාණ්ඩයක් වන ............................ උඩැක්කියේ හැඩයට සමාන වේ.

(v) මනිපුරි නර්තනයේ 'චූරි' නම් වූ මකුට පළඳනාව ............................ දෙවියන්ට වෙන්වූ විශේෂ ආභරණයකි.

(vi) විජය කුවේණි පුවතට අනුව ................................ පුරයේ තූර්ය වාදන සහිත ගීත රාවයක් ඇසුණු බව මහාවංශයේ දැක්වේ.

(vii) භරතමුනිගේ නාට්‍ය ශාස්ත්‍රයට අනුව ලෝක ධර්මී හා ......................... යනුවෙන් නාට්‍ය ශෛලීන් දෙකක් නම් කර ඇත.

(viii) නර්තනය, අනිවාර්ය විෂයක් ලෙස පාසල් විෂයමාලාවට ඇතුළත් කරන ලද්දේ ........... වර්ෂයේදී ය.

(ix) හොරණ ශ්‍රීපාලි ආයතනයට මුල්ගල තැබුවේ කිනම් වර්ෂයක කවුරුන් විසින් ද?
  (අ) වර්ෂය - ..................................
  (ආ) කවුරුන් ද - ..................................

(x) ආගමික සිද්ධස්ථානයන්හි හේවිසි වාදනය සඳහා හොරණෑව සමග යොදා ගන්නා වාද්‍ය භාණ්ඩ **දෙක** නම් කරන්න.
  (අ) ......................................
  (ආ) ......................................

**2.** (i) මැදුම් මහ දෙතිතට (3 + 4) උඩරට හෝ පහතරට හෝ සබරගමු සම්ප්‍රදායට අයත් බෙර පදයක් ප්‍රස්තාර කරන්න.

(ii) 'චන්ද නම් යස තේජ කුංකුම' ........ ප්‍රශස්ති කවිය මාත්‍රා තුනේ (3 + 3) තනි තිතට ප්‍රස්තාර කරන්න.

(iii) මුසලඩි වන්නමේ අඩව්ව හෝ ශුද්ධ තාලයේ ඉරට්ටිය හෝ කොවුලා වන්නමේ අඩව්ව ප්‍රස්තාර කරන්න.

**3.** පහත සඳහන් මාතෘකා අතුරෙන් **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

(i) සින්දු වන්නම්
(ii) වාචික අභිනය
(iii) ඔන්චිලි වාරම්
(iv) සතර බීජාක්ෂර
(v) අණ බෙර

[අටවැනි පිටුව බලන්න.

**4.** ශාන්තිකර්ම වූ කලී දේශීය නර්තන කලාවේ අනන්‍ය ලක්ෂණ පිළිබිඹු කරන සාධකයකි.

(i) පහතරට දෙවොල් මඩුවේ සිදු කෙරෙන චාරිත්‍ර විධි **දෙකක්** හඳුන්වන්න.

(ii) සබරගමු පහන් මඩුවේ භාවිත රංග වස්ත්‍රාභරණ පිළිබඳ විමසීමක් කරන්න.


(iii) කොහොඹා කංකාරි පුරාවෘත්ත කතාව මගින් සමාජයට ලබාදෙන උපදේශය පිළිබඳ විග්‍රහයක් කරන්න.

**5.** (i) කෝලම් **හෝ** සොකරි නාටකය පැවැත්වීමේ අරමුණු **දෙකක්** ලියා රඟමඬල පිළිබඳ විස්තරයක් කරන්න.

(ii) ගැමි සංස්කෘතියෙහි සමාජ සාරධර්ම හා විශ්වාස ගොඩනැගී ඇති ආකාරය ජන ගී උදාහරණයට ගෙන පෙන්වා දෙන්න.

(iii) නර්තන කලාවේ පෝෂණය සඳහා රචනා වූ පර්යේෂණාත්මක කෘතියක් නම් කර, ඒ පිළිබඳ විග්‍රහයක් කරන්න.

**6.** පහත දැක්වෙන රූපරාමු ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) Ⓐ සහ Ⓑ රූපවල ඇති දේශීය මුද්‍රා නාට්‍ය **දෙක** නම් කර, ඉන් එක් මුද්‍රානාට්‍යයක් පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(ii) භාරතීය නර්තන සම්ප්‍රදායන් දැක්වෙන රූපවල රංගවස්ත්‍රාභරණ වෙන් කොට ලියා දක්වන්න.

(iii) Ⓔ රූපයේ දැක්වෙන රූපවාහිනී නර්තනය ඇසුරෙන් වේදිකාවක භාවිත තාක්ෂණික ශිල්පක්‍රම පිළිබඳ විග්‍රහයක් කරන්න.

**7.** (i) "නර්තන කලාව හැදෑරීමෙන් සහජීවනය සහ නායකත්ව ගුණාංග වර්ධනය වේ." මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

(ii) "අන්තර්ජාතික සම්බන්ධතා මත දේශීය නර්තන කලාවේ ප්‍රගමනයට පිටිවහලක් ලැබුණි." විමසුමට ලක් කරන්න.

(iii) "විවිධ නර්තන නිර්මාණයන් බිහිවීමත් සමග ප්‍රේක්ෂක ප්‍රතිචාර හා ආකර්ෂණය වර්ධනය විය." පහත සඳහන් සිරස්තල යටතේ විමසන්න.

- වේදිකා ප්‍රසංගවල නවතම ගායන, වාදන හා නර්තන නිර්මාණ
- වෘත්තීය නර්තන කණ්ඩායම් බිහි වීම

***

රහස්‍යයි

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2018
க.பொ.த (சா.தர)ப் பரீட்சை - 2018

විෂයය අංකය / பாட இலக்கம்: **44** විෂයය / பாடம்: **නැටුම් (දේශීය)**

## I පත්‍රය - පිළිතුරු
## Iபத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 1. | 2 | 11. | 1 | 21. | 3 | 31. | 2 |
| 2. | 4 | 12. | 1 | 22. | 1 | 32. | 3 |
| 3. | 2 | 13. | 4 | 23. | 4 | 33. | 1 |
| 4. | 3 | 14. | 1 | 24. | 4 | 34. | 4 |
| 5. | 3 | 15. | 4 | 25. | 3 | 35. | 1 |
| 6. | 1 | 16. | 2 | 26. | 4 | 36. | 3 |
| 7. | 2 | 17. | 3 | 27. | 1 | 37. | 2 |
| 8. | 4 | 18. | 2 | 28. | 2 | 38. | 1 |
| 9. | 2 | 19. | 3 | 29. | 3 | 39. | 2 |
| 10. | 2 | 20. | 2 | 30. | 4 | 40. | 3 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු/ மொத்தப் புள்ளிகள் 01×40 = 40

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை: 25/40

I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி: 25/40



+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**44 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2018

**නැටුම් (දේශීය) I, II**
நடனம் (சுதேச) I, II
Dancing (Oriental) I, II

## නැටුම් (දේශීය) II

* **පළමුවැනි** ප්‍රශ්නය අනිවාර්ය වේ.
* **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම ලකුණු 12 බැගින් හිමි වේ.

1. **සියලු ම** ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ **අදාළ ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.**

   (i) අයිලය යනු උඩරට නර්තන සම්ප්‍රදායට අයත් .......................................... ශාන්තිකර්මයේ ප්‍රධාන සැරසිල්ලකි.

   (ii) කෝලම් නාටකයේ ප්‍රධාන ලක්ෂණයක් වනුයේ එක් එක් චරිත සඳහා ............................ පැළඳීමයි.

   (iii) ආහාර්ය අභිනයේ ප්‍රධාන කොටස් දෙක වනුයේ අංග රචනය සහ .......................... රචනයයි.

   (iv) කථකලි නර්තනයේ වාද්‍ය භාණ්ඩයක් වන ............................ උඩැක්කියේ හැඩයට සමාන වේ.

   (v) මනිපුරි නර්තනයේ 'චූරි' නම් වූ මකුට පළඳනාව .......................... දෙවියන්ට වෙන්වූ විශේෂ ආභරණයකි.

   (vi) විජය කුවේණි පුවතට අනුව .................................. පුරයේ තූර්ය වාදන සහිත ගීත රාවයක් ඇසුණු බව මහාවංශයේ දැක්වේ.

   (vii) භරතමුනිගේ නාට්‍ය ශාස්ත්‍රයට අනුව ලෝක ධර්මී හා .......................... යනුවෙන් නාට්‍ය ශෛලීන් දෙකක් නම් කර ඇත.

   (viii) නර්තනය, අනිවාර්ය විෂයක් ලෙස පාසල් විෂයමාලාවට ඇතුළත් කරන ලද්දේ ........... වර්ෂයේදී ය.

   (ix) හොරණ ශ්‍රීපාලි ආයතනයට මුල්ගල තැබුවේ කිනම් වර්ෂයක කවුරුන් විසින් ද?
   (අ) වර්ෂය - ....................................
   (ආ) කවුරුන් ද - ....................................

   (x) ආගමික සිද්ධස්ථානයන්හි හේවිසි වාදනය සඳහා හොරණෑව සමග යොදා ගන්නා වාද්‍ය භාණ්ඩ **දෙක** නම් කරන්න.
   (අ) ....................................
   (ආ) ....................................

2. (i) මැදුම් මහ දෙතිතට (3 + 4) උඩරට හෝ පහතරට හෝ සබරගමු සම්ප්‍රදායට අයත් බෙර පදයක් ප්‍රස්තාර කරන්න.

   (ii) 'චන්ද නම් යස තේජ කුංකුම' ......... ප්‍රශස්ති කවිය මාත්‍රා තුනේ (3 + 3) තනි තිතට ප්‍රස්තාර කරන්න.

   (iii) මුසලඩි වන්නමේ අඩව්ව හෝ ශුද්ධ තාලයේ ඉරට්ටිය හෝ කොවුලා වන්නමේ අඩව්ව ප්‍රස්තාර කරන්න.

3. පහත සඳහන් මාතෘකා අතුරෙන් **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

   (i) සින්දු වන්නම්
   (ii) වාචික අභිනය
   (iii) ඔන්චිලි වාරම්
   (iv) සතර බීජාක්ෂර
   (v) අණ බෙර



+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

**4.** ශාන්තිකර්ම වූ කලී දේශීය නර්තන කලාවේ අනන්‍ය ලක්ෂණ පිළිබිඹු කරන සාධකයකි.

(i) පහතරට දෙවොල් මඩුවේ සිදු කෙරෙන චාරිත්‍ර විධි **දෙකක්** හඳුන්වන්න.

(ii) සබරගමු පහන් මඩුවේ භාවිත රංග වස්ත්‍රාභරණ පිළිබඳ විමසීමක් කරන්න.

(iii) කොහොඹා කංකාරි පුරාවෘත්ත කතාව මගින් සමාජයට ලබාදෙන උපදේශය පිළිබඳ විග්‍රහයක් කරන්න.

**5.** (i) කෝලම් **හෝ** සොකරි නාටකය පැවැත්වීමේ අරමුණු **දෙකක්** ලියා රඟමඬල පිළිබඳ විස්තරයක් කරන්න.

(ii) ගැමි සංස්කෘතියෙහි සමාජ සාරධර්ම හා විශ්වාස ගොඩනැගී ඇති ආකාරය ජන ගී උදාහරණයට ගෙන පෙන්වා දෙන්න.

(iii) නර්තන කලාවේ පෝෂණය සඳහා රචනා වූ පර්යේෂණාත්මක කෘතියක් නම් කර, ඒ පිළිබඳ විග්‍රහයක් කරන්න.

**6.** පහත දැක්වෙන රූපරාමු ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) Ⓐ සහ Ⓑ රූපවල ඇති දේශීය මුද්‍රා නාට්‍ය **දෙක** නම් කර, ඉන් එක් මුද්‍රානාට්‍යයක් පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(ii) භාරතීය නර්තන සම්ප්‍රදායන් දැක්වෙන රූපවල රංගවස්ත්‍රාභරණ වෙන් කොට ලියා දක්වන්න.

(iii) Ⓔ රූපයේ දැක්වෙන රූපවාහිනී නර්තනය ඇසුරෙන් වේදිකාවක භාවිත තාක්ෂණික ශිල්පක්‍රම පිළිබඳ විග්‍රහයක් කරන්න.

**7.** (i) "නර්තන කලාව හැදෑරීමෙන් සහජීවනය සහ නායකත්ව ගුණාංග වර්ධනය වේ." මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

(ii) "අන්තර්ජාතික සම්බන්ධතා මත දේශීය නර්තන කලාවේ ප්‍රගමනයට පිටිවහලක් ලැබුණි." විමසුමට ලක් කරන්න.

(iii) "විවිධ නර්තන නිර්මාණයන් බිහිවීමත් සමග ප්‍රේක්ෂක ප්‍රතිචාර හා ආකර්ෂණය වර්ධනය විය." පහත සඳහන් සිරස්තල යටතේ විමසන්න.

- වේදිකා ප්‍රසංගවල නවතම ගායන, වාදන හා නර්තන නිර්මාණ
- වෘත්තීය නර්තන කණ්ඩායම් බිහි වීම



+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

# 44 - නැටුම් (දේශීය) - II

| | | | | ලකුණු | |
|---|---|---|---|---|---|
| 1. | (i) | කොහොඹා කංකාරිය | | 1 | |
| | (ii) | වෙස් මුහුණු | | 1 | |
| | (iii) | වෙස් මෝස්තර | | 1 | |
| | (iv) | චිඩැක්ක | | 1 | |
| | (v) | ක්‍රිෂ්ණ | | 1 | |
| | (vi) | සිරිසවත්තු | | 1 | |
| | (vii) | නාට්‍ය ධර්මී | | 1 | |
| | (viii) | 1972 | | 1 | |
| | (ix) | (අ) | 1934 | 1 | 2 |
| | | (ආ) | රබීන්ද්‍රනාත් තාගෝර් තුමා | 1 | |
| | (x) | (අ) | දවුල | 1 | 2 |
| | | (ආ) | තම්මැට්ටම | 1 | |

(i) සිට (viii) දක්වා පිළිතුරකට ලකුණු 01 බැගින් ලකුණු 08

(ix) සිට (x) දක්වා පිළිතුරකට ලකුණු 02 බැගින් ලකුණු 04

**මුළු ලකුණු (8 + 4) = 12**



+94 71 800 8533 / +94 77 088 2228
WWW.PADANAMAPUBLICATION.LK

2. (i) **මැදුම් මහ දෙතිතට (3 + 4) උඩරට හෝ පහතරට හෝ සබරගමු සම්ප්‍රදායට අයත් බෙරපදයක් ප්‍රස්තාර කරන්න.**

<u>උඩරට නර්තන සම්ප්‍රදාය</u>

බෙර පදය - දෝං ජිං ජිං තකට දොංතක

| ∧ | | | / | | | | ∧ | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 |
| දෝං | - | - | ජිං | - | ජිං | - | ත | ක | ට | දොං | - | ත | ක |

<u>පහතරට නර්තන සම්ප්‍රදාය</u>

බෙර පදය - ගුංද ගතිගත ගත්ත ගුදිගුඳ

| ∧ | | | / | | | | ∧ | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 |
| ගුං | - | ද | ග | ති | ග | ත | ගත් | - | ත | ගු | දි | ගු | ඳ |

<u>සබරගමු නර්තන සම්ප්‍රදාය</u>

බෙර පදය - ජිංත තත්කිට තකිට ජිංතක

| ∧ | | | / | | | | ∧ | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 |
| ජිං | - | ත | තත් | - | කි | ට | ත | කි | ට | ජිං | - | ත | ක |

ආදී වශයෙන් අදාල තිත්රූපයට බෙරපදයක් ප්‍රස්තාර කර ඇත්නම්

විභාග කර දැක්වීම හා සංකේත සඳහා - ලකුණු 02

බෙර පදය ප්‍රස්තාර කිරීමට - ලකුණු 02

**ලකුණු 04**

PADANAMA PUBLICATION



+94 71 800 8533 / +94 77 088 2228

WWW.PADANAMAPUBLICATION.LK

**(ii) 'චන්ද නම් යස තේජ කුංකුම' ............ ප්‍රශස්ති කවිය මාත්‍රා තුනේ (3 + 3) තනිතිතට ප්‍රස්තාර කරන්න.**

| / | | | / | | | / | | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| + | චන් | ද | නම් | ය | ස | තේ | - | ජ | කුං | කු | ම |
| + | ඇන් | ද | දි | ග | ඟ | නන් | - | උ | ර | ත | ල |
| + | බින් | දු | ස | තු | රු | අ | ඳු | රු | පැ | හැ | ර |
| + | බුන් | දු | ක | ම | ල | සේ | - | - | - | - | - |

විභාග කර දැක්වීම හා සංකේත සඳහා - ලකුණු 02

කවි පාදය ප්‍රස්තාර කිරීමට - ලකුණු 02

**ලකුණු 04**

**(iii) මුසලඩි වන්නමේ අඩව්ව හෝ ශුද්ධ තාලයේ ඉරට්ටිය හෝ කොවුලා වන්නමේ අඩව්ව ප්‍රස්තාර කරන්න.**

**උඩරට මුසලඩි වන්නමේ අඩව්ව**

| ∧ | | | / | | | | ∧ | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 |
| තා | - | කු | තක් | කුං | තරි | කිට | ත | කු | ඳ | තත් | - | ජෙං | - |
| + | + | + | තත් | - | ජෙං | - | ත | ජෙං | - | තත් | - | ජෙං | - |
| ජි | - | කු | ජික් | කුං | තරි | කිට | ජි | කු | ඳ | තත් | - | ජෙං | - |
| + | + | + | තත් | - | ජෙං | - | ත | ජෙං | - | තත් | - | ජෙං | - |
| තා | - | කු | තක් | කුං | තරි | කිට | ත | කු | ඳ | තත් | - | ජෙං | - |
| ජි | - | කු | ජික් | කුං | තරි | කිට | ජි | කු | ඳ | තත් | - | ජෙං | - |
| තා | - | කු | තක් | කුං | තරි | කිට | ජි | - | කු | ජික් | කුං | තරි | කිට |
| ත | කු | ඳ | තත් | - | ජෙං | - | - | - | - | තත් | - | ජෙං | - |
| ත | ජෙං | - | තත් | - | ජෙං | - | - | - | - | ජෙං | - | තා | - |
| ජෙ | - | තා | ජෙ | ත | කු | ඳ | ජෙං | - | ත | තා | | | |



+94 71 800 8533 / +94 77 088 2228

WWW.PADANAMAPUBLICATION.LK

**පහතරට ශුද්ධ තාලය සින්දු වන්නමේ ඉරට්ටිය**

| ^ 1 | 2 | ^ 1 | 2 | / 1 | 2 | 3 | ^ 1 | 2 | ^ 1 | 2 | / 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| තත් | - | ගු | ඳ | ග | ත | - | දිත් | - | දිත් | - | තෙයි | - | - |
| ග | ත | ගු | ඳ | ග | ත | - | දිත් | - | දිත් | - | තෙයි | - | - |
| තත් | - | ගු | ඳ | ග | ත | - | ග | ත | ගු | ඳ | ග | ත | - |
| ගු | ඳ | ගත් | - | ගු | ඳ | ගත | තත් | - | ගු | ඳ | ග | ත | - |
| දිත් | - | දිත් | - | තෙයි | - | - | | | | | | | |

**සබරගමු කොවුලා වන්නමේ අඩව්ව**

| ^ 1 | 2 | 3 | / 1 | 2 | 3 | 4 | ^ 1 | 2 | 3 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| තාත් | - | - | තජ් | - | ජිත් | - | ත | ක | ට | තජ් | - | ජිත් | - |
| කි | නම් | - | තජ් | - | ජිත් | - | ග | ත | කු | දා | - | තරි | කිට |
| ත | ක | ට | තා | - | තරි | කිට | ත | ක | ට | තා | - | තරි | කිට |
| ත | ක | ට | තා | - | - | - | කු | දි | ත | ග | ත | ග | ත |
| ග | ති | ත | කු | ඳ | කු | ඳ | දොං | - | ත | ගත් | - | තත් | - |
| ග | තත් | - | කු | ඳ | ග | ත | තා | - | - | ගත් | - | තත් | - |
| ග | තත් | - | කු | ඳ | ග | ත | ත | හරි | ත | තා | - | | |

විභාග කර දැක්වීම හා සංකේත සඳහා - ලකුණු 02
ඉරට්ටිය/අඩව්ව ප්‍රස්තාර කිරීමට - ලකුණු 02

**ලකුණු 04**

**මුළු ලකුණු (4 x 3) = 12**



+94 71 800 8533 / +94 77 088 2228
WWW.PADANAMAPUBLICATION.LK

3. **පහත සඳහන් මාතෘකා අතුරෙන් තුනක් කෙටියෙන් විස්තර කරන්න.**

(i) **සින්දු වන්නම් :-**

- පහතරට නර්තන සම්ප්‍රදායට අයත් බව
- විෂ්ණු හෙවත් උපුල්වන් දෙවියන්ගේ ගුණ වර්ණනා වන බව
- දෙවියන්ට පූජෝපහාරයක් ලෙස රචනා වී ඇති බව
- දඹදෙනි, කෝට්ටේ යුගයේ රචිත බව
- සින්දු වන්නම් 32 දම්වැලක පුරුක් මෙන් එකිනෙකට සම්බන්ධ වී තිබීම සුවිශේෂී බව
- සෑම සින්දුවන්නමකටම තාලයක් හා විරිතක් ඇතිබව
- උදාහරණ නාමිකව දක්වා තිබේ නම්

ඉහත කරුණු වලින් **හතරක්** වත් ලියා තිබේ නම්
**ලකුණු** 04

(ii) **වාචික අභිනය :-**

- සතර අභිනයට අයත් වන බව
- අදහස් ප්‍රකාශනයේ දී වචන ප්‍රබල මාධ්‍යයක් බව
- පද්‍ය, ගීත, සංවාද වාචික අභිනයට අයත් බව
- ශාන්තිකර්මවල එන නාට්‍යය අවස්ථාවලදී අවස්ථා නිරූපනය සඳහා බහුල වශයෙන් යොදා ගන්නා බව

ඉහත කරුණු විස්තර කර ඇත්නම්
**ලකුණු** 04

(iii) **ඔන්චිලි වාරම් :-**

- අවුරුදු කාලයේදී ජන ක්‍රීඩාවක් ලෙස ඔන්චිලි වාරම් යොදා ගන්නා බව
- ත්‍රිවිධ රත්නය සහ පත්තිනි දෙවියන් ප්‍රධාන කොට ගායනා සැකසී ඇති බව
- ආඝාතාත්මක හා අනාඝාතාත්මකව ගායනා කරන බව
- විවිධ නාද මාලා ඇති බව
- බුදු ගුණ, තුන් සරණේ කවි සහ දෙවි දේවතාවුන්ට පින්දීමේ කවිද දක්නට ඇති බව
- විනෝදාස්වාදය සඳහා මෙම කවි ගායනා කරන බව
- ඔන්චිලි වාරම් කවියක් උදාහරණ ලෙස දක්වා තිබේ නම්

ඉහත කරුණු වලින් **හතරක්** වත් ලියා තිබේ නම්
**ලකුණු** 04

(iv) **සතර බීජාක්ෂර :-**

- තත් ජිත් තොං නං යන අක්ෂර සතර බීජාක්ෂර වන බව
- අවනද්ධ භාණ්ඩ වාදනය කිරීමේදී ඉපදෙන මූලික අක්ෂර මෙනමින් හඳුන්වන බව
- ශිල්පීය දක්ෂතා සඳහා සතර බීජාක්ෂර පිළිබඳ අවබෝධය වැදගත් වන බව
- උදාහරණ දක්වා තිබේ නම්

ඉහත කරුණු වලින් විස්තර කර තිබේ නම්
**ලකුණු** 04

(v) **අණ බෙර :-**

- අතීතයේ සන්නිවේදන කාර්ය සඳහා යොදාගත් අවස්ථාවක් බව
- යම්කිසි රාජාඥාවන් දන්වා සිටීම සඳහා යොදා ගත් බව
- විශේෂිත වූ බෙර පද කොටසක් මේ සඳහා වාදනය කරන බව
- දවුල භාවිත කරන බව

ඉහත කරුණු විස්තර කර තිබේ නම්
**ලකුණු** 04

**මෙයින් තුනක් තෝරා ගෙන කෙටි සටහන් ලියා ඇත්නම් මුළු ලකුණු** (4 x 3) = 12

04. **ශාන්තිකර්ම වූ කලී දේශීය නර්තන කලාවේ අනන්‍ය ලක්ෂණ පිළිබිඹු කරන සාධකයකි.**

(i) **පහතරට දෙවොල් මඩුවේ සිදුකෙරෙන චාරිත්‍ර විධි දෙකක් හඳුන්වන්න.**

දෙවොල් මඩුවේ සිදු කෙරෙන චාරිත්‍ර විධි

- කප් සිටුවීම
- මඩුපේ කිරීම
- තොටමෙට යාම
- පිදේනි ඔප්පු කිරීම
- මිල්ල කැපීම
- බිසෝකප සිටුවීම ................ ආදි චාරිත්‍ර දෙකක් හඳුන්වා ඇත්නම්

නම් කිරීමට ලකුණු 02
විස්තර කිරීමට ලකුණු 02

**ලකුණු** 04

(ii) **සබරගමු පහන් මඩුවේ භාවිත රංගවස්ත්‍රාභරණ පිළිබඳ විමසීමක් කරන්න.**

- පහන් මඩුවේ රංගවස්ත්‍රාභරණ නම්කර හඳුන්වා ඇත්නම්

නම් කිරීමට ලකුණු 02
හැඳින්වීමට ලකුණු 02

**ලකුණු** 04

(iii) **කොහොඹා කංකාරි පුරාවෘත්ත කතාව මගින් සමාජයට ලබාදෙන උපදේශය පිළිබඳ විග්‍රහයක් කරන්න.**

- පවුල් සංස්ථාව බිඳියාම
- පොරොන්දු කඩකිරීම, වෛරය, පළිගැනීම වැනි සමාජ අකටයුතුකම් සඳහා දඬුවම් හිමිවන බව උදාහරණ සහිතව

කරුණු හතරක් පැහැදිලි කර ඇත්නම් **ලකුණු** 04

**මුළු ලකුණු** (4 x 3) = 12



+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

05.

(i) **කෝලම් හෝ සොකරි නාටකය පැවැත්වීමේ අරමුණු දෙකක් ලියා රඟමඩල පිළිබඳ විස්තරයක් කරන්න.**

- කෝලම් හෝ සොකරි නාටකය පැවැත්වීමේ අරමුණු
- රඟමඩල ස්වභාවය පිළිබඳ විස්තර කිරීම

අරමුණු දෙකක් ලියා ඇත්නම් ලකුණු 02
විස්තර කිරීමට ලකුණු 02

**ලකුණු** 04

(ii) **ගැමි සංස්කෘතියෙහි සමාජ සාරධර්ම හා විශ්වාස ගොඩනැගී ඇති ආකාරය ජන ගී උදාහරණයට ගෙන පෙන්වා දෙන්න.**

- සමාජ සාරධර්ම, විශ්වාස හා බැඳී ජන කවි උදාහරණ ලෙස තෝරාගැනීම
- එම ගීතවල සමාජ සාරධර්ම, ආගමික විශ්වාස මනාව ගැබ්ව පවතින බව
- සමගිය හා සාමූහිකත්වය ජන ගී වලින් මතු වී, ගැමි සංස්කෘතිය පෝෂණය වන බව

ඉහත කරුණු දක්වමින් විස්තර කර ඇත්නම්

**ලකුණු** 04

(iii) **නර්තන කලාවේ පෝෂණය සඳහා රචනා වූ පර්යේෂණාත්මක කෘතියක් නම් කර, ඒ පිළිබඳ විග්‍රහයක් කරන්න.**

- පර්යේෂණ කෘතියක් නම් කර ඇත්නම්
- විෂය ක්ෂේත්‍රය හා විෂය අන්තර්ගතය විස්තර කර ඇත්නම්

කෘතිය හා කතෘ නම් කර ඇත්නම් ලකුණු 02
විස්තර කිරීමට ලකුණු 02

**ලකුණු** 04

**මුළු ලකුණු** (4 x 3) = 12



+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

**06. පහත දැක්වෙන රූපරාමු ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

**(i) Ⓐ සහ Ⓑ රූපවල ඇති දේශීය මුද්‍රානාට්‍ය දෙක නම් කර, ඉන් එක් මුද්‍රානාට්‍යයක් පිළිබඳ හැඳින්වීමක් කරන්න.**

- Ⓐ - කුඹි කතාව Ⓑ - කරදිය

**කුඹි කතාව**

- නිෂ්පාදනය, පිටපත, රංගරචනය, කලා කටයුතු හා රංගවස්ත්‍ර නිර්මාණය, සංගීතය ආදි කරුණු පිළිබඳ ලියා තිබීම
- කුඹි පවුලක් වටා ගෙතුනු කතාවක් බව විස්තර කර තිබීම

**කරදිය**

- නිෂ්පාදනය, රංගරචනය, සංගීතය, වේදිකා සැරසිලි හා රංගවස්ත්‍රාභරණ පිළිබඳ කරුණු ලියා තිබීම
- ධීවර ගම්මානයක ජනජීවිතය ඇසුරෙන් ගෙතුනු කතාවක් බව විස්තර කර තිබීම

නම් කිරීමට ලකුණු 02

හැඳින්වීමට ලකුණු 02

**ලකුණු** 04

**(ii) භාරතීය නර්තන සම්ප්‍රදායන් දැක්වෙන රූපවල රංගවස්ත්‍රාභරණ වෙන් කොට ලියා දක්වන්න.**

**කථකලි රංග වස්ත්‍රාභරණ**

- කිරීටම්, කුප්පායම්, ශෙට්ටි, කළුතාරම්.......ආදි රංගවස්ත්‍රාභරණ ලියා ඇත්නම්

**මනිපුරි රංග වස්ත්‍රාභරණ**

- කුමින්, පොශ්වාන්, ක්වංගොයි, රිෂම්පුරිට්, මයිකුම්, කොක්තුම්බි, ධෝතිය, මකුට පළඳනාව.......ආදි වශයෙන් රංගවස්ත්‍රාභරණ පිළිබඳ ලියා ඇත්නම්

සම්ප්‍රදායන් දෙකේ රූපවල රංගවස්ත්‍රාභරණ වෙන්කොට ලියා ඇත්නම්

**ලකුණු** (2 x 2 = 4)

**(iii) Ⓔ රූපයේ දැක්වෙන රූපවාහිනී නර්තනය ඇසුරෙන් වේදිකාවක භාවිත තාක්‍ෂණික ශිල්පක්‍රම පිළිබඳ විග්‍රහයක් කරන්න.**

- අධිවේගී / මන්දවේගී දර්ශන
- සමීප / දුරස්ථ දර්ශන
- ප්‍රතිබිම්බ නිර්මාණය
- ගායනය, වාදනය සඳහා තාක්‍ෂණික ක්‍රමශිල්ප යොදා ගැනීම
- ආලෝකකරණය
- තාක්‍ෂණික ක්‍රමශිල්ප තුළින් රංගවස්ත්‍රාභරණ වල සිදුවන වෙනස්කම් ආදි කරුණු හතරක් ඇසුරෙන් විග්‍රහයක් කර ඇත්නම්

**ලකුණු** 04

**මුළු ලකුණු** (4 x 3) = 12



+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

07.

(i) **"නර්තන කලාව හැදෑරීමෙන් සහජීවනය සහ නායකත්ව ගුණාංග වර්ධනය වේ." මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.**

- සංස්කෘතික හරපද්ධතීන් ආරක්ෂා කිරීමක් සිදුවන බව
- ශාන්තිකර්ම අවස්ථා මගින් උදාහරණ දක්වා තිබීම
  (ආගන්තුක සත්කාරය, බතබුලතින් සංග්‍රහ කිරීම, ශිල්පීන් අතර ආචාර සමාචාර......ආදි)
- පන්තිකාමර ක්‍රියාවලිය තුළින් උදාහරණ දක්වා තිබීම
  (කණ්ඩායම් ක්‍රියාකාරකම්, නායකත්වයට ගරුකිරීම, බිම වාඩිවී ශිල්ප ශාස්ත්‍ර හැදෑරීම.....ආදි)
- සෞන්දර්යාත්මක සිතුවිලි යහපත් සමාජයක් බිහිවීමට මග සැලසෙන බව.....

ආදී කරුණු ඇසුරෙන් අදහස් දක්වා තිබේ නම්
**ලකුණු** 04

(ii) **"අන්තර්ජාතික සම්බන්ධතා මත දේශීය නර්තන කලාවේ ප්‍රගමනයට පිටිවහලක් ලැබුණි." විමසුමට ලක් කරන්න.**

- භාරතීය හා බටහිර ආභාෂය
- විදේශීය නර්තනයන් අධ්‍යයනය සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීම
- දේශීය නර්තන කණ්ඩායම් ජාත්‍යන්තර උළෙල නියෝජනය
- ජාත්‍යන්තර නර්තන සංදර්ශන සහ තරඟ සඳහා දේශීය නර්තන නියෝජනය
- විදේශීය සංචාරකයින් සඳහා පවත්වනු ලබන නර්තන සංදර්ශන

ආදී කරුණු විමසුමට ලක්කර තිබේනම්

**ලකුණු** 04

(iii) **"විවිධ නර්තන නිර්මාණයන් බිහිවීමත් සමග ප්‍රේක්ෂක ප්‍රතිචාර හා ආකර්ෂණය වර්ධනය විය." පහත සඳහන් සිරස්තල යටතේ විමසන්න.**

**වේදිකා ප්‍රසංගවල නවතම ගායන, වාදන හා නර්තන නිර්මාණ**

- විවිධ සංගීත සංයෝජන හා ගායනා යොදාගනිමින් නර්තන නිර්මාණය කරන බව
- වාදනය සඳහා දේශීය හා බටහිර වාද්‍ය භාණ්ඩ යොදාගන්නා බව
- නිර්මාණාත්මක නර්තන තුළින් ප්‍රේක්ෂක ප්‍රතිචාර හා ආකර්ශනය වර්ධනය වී ඇති බව

ආදී කරුණු දක්වා තිබේ නම්

**ලකුණු** 02

**වෘත්තීය නර්තන කණ්ඩායම් බිහිවීම**

- වෘත්තීය නර්තන කණ්ඩායම් නම්කර තිබේනම්
- කණ්ඩායම් වල විවිධ අරමුණු දක්වා තිබේනම්
- කාන්තා දායකත්වය, ප්‍රේක්ෂක ප්‍රතිචාර හා ආකර්ෂණය වර්ධනය වීමට හේතු වී ඇතිබව

ආදී කරුණු සඳහන් කරමින් විමසීමක් කර තිබේනම්

**ලකුණු** 02

**ලකුණු** 04

**මුළු ලකුණු** (4 x 3) = 12

# 10 සහ 11 ශ්‍රේණි සඳහා ග්‍රන්ථ නාමාවලිය

## (අ.පො.ස) සාමාන්‍ය පෙළ
## 11 ශ්‍රේණිය - කෙටි සටහන්

**සිංහල මාධ්‍ය**

- 10-11 සිංහල ව්‍යාකරණ
- 10-11 සිංහල සාහිත්‍යය රසාස්වාදය
- බුද්ධ ධර්මය
- කතෝලික ධර්මය
- සිංහල භාෂාව හා සාහිත්‍යය
- සිංහල සාහිත්‍යය සංග්‍රහය
- English Language
- ගණිතය - 1
- ගණිතය - 2
- ජීව විද්‍යාව
- භෞතික විද්‍යාව
- රසායන විද්‍යාව
- ඉතිහාසය
- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
- භූගෝල විද්‍යාව
- පුරවැසි අධ්‍යාපනය
- පෙරදිග සංගීතය
- නර්තනය
- නාට්‍ය හා රංග කලාව
- චිත්‍ර කලාව
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
- සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
- සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය
- කෘෂි හා ආහාර තාක්ෂණය
- ගෘහ ආර්ථික විද්‍යාව

## 11 ශ්‍රේණිය - ප්‍රශ්නෝත්තර

**සිංහල මාධ්‍ය**

- සිංහල භාෂාව හා සාහිත්‍යය
- බුද්ධ ධර්මය
- ඉතිහාසය
- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
- පුරවැසි අධ්‍යාපනය

## Grade 11 - Short Notes

**English Medium**

- Buddhism
- Mathematics - 1
- Mathematics - 2
- Biology
- Physics
- Chemistry
- History
- Business & Accounting Studies
- Geography
- Civic Education
- ICT
- Health & Physical Education
- 10-11 English Literary (Poetry)
- 10-11 English Literary (Drama)
- 10-11 English Literary (Short Story)

## Grade 11 - Model Papers

**English Medium**

- Civic Education

## 10 ශ්‍රේණිය - කෙටි සටහන්

**සිංහල මාධ්‍ය**

- බුද්ධ ධර්මය
- කතෝලික ධර්මය
- සිංහල භාෂාව හා සාහිත්‍යය
- සිංහල සාහිත්‍යය සංග්‍රහය
- සිංහල රචනා අත්වැල
- English Language
- ගණිතය - 1
- ගණිතය - 2
- ජීව විද්‍යාව
- භෞතික විද්‍යාව
- රසායන විද්‍යාව

- ඉතිහාසය
- ඉතිහාසය රූප සටහන් අශ්‍රිත කෙටි සටහන්
- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - 1
- ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - 2
- භූගෝල විද්‍යාව
- පුරවැසි අධ්‍යාපනය
- පෙරදිග සංගීතය
- නර්තනය
- නාට්‍ය හා රංග කලාව
- චිත්‍ර කලාව
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
- සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
- සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය
- කෘෂි හා ආහාර තාක්ෂණය
- ගෘහ ආර්ථික විද්‍යාව
- ජපන් භාෂාව

## 10 ශ්‍රේණිය - ප්‍රශ්නෝත්තර

**සිංහල මාධ්‍ය**

- සිංහල භාෂාව හා සාහිත්‍යය
- බුද්ධ ධර්මය
- ගණිතය
- විද්‍යාව
- ඉතිහාසය
- පුරවැසි අධ්‍යාපනය
- භූගෝල විද්‍යාව
- පෙරදිග සංගීතය

## පාඩමෙන් පාඩමට මාසික ඇගයීම්

**සිංහල මාධ්‍ය**

- 10-ශ්‍රේණිය - විද්‍යාව
- 11-ශ්‍රේණිය - විද්‍යාව

## Grade 10 - Short Notes

**English Medium**

- Buddhism
- Mathematics - 1
- Mathematics - 2
- Biology
- Physics
- Chemistry
- History
- Business & Accounting Studies - 1
- Business & Accounting Studies - 2
- Geography
- Civic Education
- ICT
- Health & Physical Education

## Grade 10 - Model Papers

**English Medium**

- Mathematics
- Science
- Civic Education
- Geography
- English Activity Book
- English Work Book

## අනෙකුත් ග්‍රන්ථ

- හෙළදිව කතිකාවත - අරුණශාන්ත අමරසිංහ
- හොල්මන් අවතාර සහ යකදුරන් - අරුණශාන්ත අමරසිංහ
- සිසු-ගුරු අත්පොත නාට්‍ය හා රංග කලාව 10-11 ශ්‍රේණි සඳහා (නව විෂය නිර්දේශය) - නන්දන අල්ගේවත්ත

සියලු ම ශ්‍රේණි සඳහා කෙටි සටහන්, ප්‍රශ්න පත්‍ර කට්ටල සහ වැඩ පොත් අප සතුව තිබෙන අතර, මෙම ඕනෑම ග්‍රන්ථයක් වට්ටම් සහිත ව ඔබේ නිවසට ම ගෙන්වා ගත හැකි ය.